# දේශීය සාහිත්‍ය මූලාශ්‍රය මගින් හෙළිවන ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පැවති දේශපාලන සම්බන්ධතා (අනුරාධපුර යුගය අවසානය දක්වා)

කේ. ඒ. එස්. එස් කළු ආරච්චි
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
sandali.sandamini@.gmail.com

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව අතීතයේ සිටම අනෙකුත් විදේශීය රාජ්‍යයන් සමඟ සම්බන්ධතා පවත්වා ඇත. මේ ආකාරයට සබඳතා පැවැත් වූ රාජ්‍යයන් අතරින් ඉන්දියාව ප්‍රධාන වේ. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පැවති සබඳතා විවිධ ස්වරූපයන්ගෙන් යුක්ත වූ අතර ඒවා ලාංකීය ඉතිහාසය හැඩගැස්වීමෙහිලා සෘජු බලපෑමක් එල්ල කර ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ ඈත අතීතයේ සිට අනුරාධපුර යුගයේ අවසානය දක්වා දේශීය සාහිත්‍යය මූලාශ්‍රය මගින් හෙළිවන ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පැවති දේශපාලනික සම්බන්ධතා හා එවායේ ස්වරූපය පිළිබඳවත් එම සම්බන්ධතා ලාංකීය ඉතිහාසය හැඩගැස්වීම කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳවත් විමසා බැලීම වේ. මෙම අධ්‍යයනයේ දී ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය මෙන්ම ද්වීතිය සාහිත්‍ය මූලාශ්‍රය ද යොදාගනු ලැබීය.

ඈත අතීතයේ සිට අනුරාධපුර යුගයේ අවසානය දක්වා වූ කාල පරිච්ඡේදය ශ්‍රී ලංකා ඉතිහාසය තුළ සුවිශේෂී කාලවකවානුවක් ලෙස හැඳින්විය හැක. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පිහිටීම සම්බන්ධයෙන් පවතින සුවිශේෂී භූගෝලීය සාධකයන් විදේශ සබඳතා ගොඩනගා ගැනීමේ දී ප්‍රධාන වශයෙන් බලපෑම් ඇති කර ඇත. ඉන්දියාවේ උතුරු ප්‍රදේශය හා දකුණු ප්‍රදේශය සමඟ ශ්‍රී ලංකාව අඩු වැඩි වශයෙන් දේශපාලනික සබඳතා පවත්වා ඇත. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පැවති මෙම සම්බන්ධතා පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ශ්‍රී ලංකා ඉතිහාසය කෙරෙහි ප්‍රබල බලපෑමක් එල්ල කරනු ලැබුවේ දේශපාලනික සබඳතා බව පෙනේ. ක්‍රම ක්‍රමයෙන් විකාශනය වූ රාජත්වය කෙරෙහි ඉන්දියාව විසින් ඇති කළ දේශපාලනික බලපෑම් පිළිබඳ ඉතිහාසය විජයාගමනයෙන් ආරම්භ වී සංක්‍රමණ, අක්‍රමණ, දූත සබඳතා පැවැත්වීම දක්වා වර්ධනය වී ගිය ආකාරයක් ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී පෙනී යයි. මෙසේ ඇතිකරගත් ශ්‍රී ලංකා ඉන්දියා දේශපාලනික සම්බන්ධතා ලංකීය ඉතිහාසය කෙරෙහි යහපත් අයහපත් බලපෑම් රැසක් එල්ල කළ බව පෙනේ. එමෙන්ම ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පැවති දේශපාලන සම්බන්ධතා අතර උතුරු ඉන්දියානු සබඳතාවලට වඩා දකුණු ඉන්දියානු සබඳතා ලාංකීය ඉතිහාසය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ බව කිව හැකිය.

**ප්‍රමුඛ පද : ඉන්දියාව, විදේශ සම්බන්ධතා, සංක්‍රමණ, ආක්‍රමණ**